රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
Independence Square, Colombo 07, Sri Lanka

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | MPA/PSD/SP PRO/2024 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2024.07.17 |

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>

අංක 1670/32 දරන 2010.09.10 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අංක 2196/42 හා 2020.10.08 දිනැතිව කරන ලද ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන අනුව 2024.07.01 දිනට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලැබූ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.

02. ඒ අනුව, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ 2024.07.01 දිනට පවත්නා පුරප්පාඩු පහක් (05) පිරවීම සඳහා අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් නිලධාරීන් අතරින් ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන නිලධාරීන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට මෙයින් කටයුතු කරනු ලැබේ.

03. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් පහත සඳහන් විෂයයන්ගෙන් කවර එකකට හෝ අයත් විෂයය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම. මෙම පශ්චාත් උපාධියට අවම වශයෙන් වර්ෂ එකක අධ්‍යයන කටයුතු ඇතුළත් විය යුතු වේ.

(අ) සංවර්ධන සැලසුම්කරණය / සංවර්ධන අධ්‍යාපනය / ව්‍යාපෘති සැලසුම්කරණය / ව්‍යාපෘති කළමනාකරණය
(ආ) ආර්ථික විද්‍යාව / ආර්ථික මිතිය / මූල්‍ය ආර්ථික විද්‍යාව / සංවර්ධන ආර්ථික විද්‍යාව
(ඇ) වාණිජ්‍ය / මූල්‍ය කළමනාකරණය
(ඈ) සමාජ විද්‍යාව / සමාජ වැඩ / ප්‍රජා සංවර්ධනය / අධ්‍යාපනය / පෝෂණය / සෞඛ්‍ය
(ඉ) ගණිතය / සංඛ්‍යාන විද්‍යාව / ප්‍රමාණාත්මක ශිල්පක්‍රම සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණය

දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk

(ඊ) කෘෂිකර්මය / සත්ව පාලනය / පරිසර විද්‍යාව / කෘෂි ආර්ථික විද්‍යාව
(උ) තොරතුරු තාක්ෂණය / පරිගණක විද්‍යාව / කළමනාකරණ තොරතුරු පද්ධති (MIS)
(ඌ) භූගෝල විද්‍යාව / ප්‍රාදේශීය සංවර්ධනය / නාගරික සංවර්ධනය / නාගරික සහ ප්‍රාදේශීය සැලසුම්කරණය / භූගෝල විද්‍යාත්මක තොරතුරු පද්ධතිය / ජනගහන විද්‍යාව / ජනගහන අධ්‍යයනය
(එ) මානව සම්පත් කළමනාකරණය / අලෙවි කළමනාකරණය / සන්නිවේදනය
(ඒ) භෞතික සැලසුම්කරණය / ප්‍රවාහන සැලසුම්කරණය / නගර සහ ග්‍රාමීය සැලසුම්කරණය / කර්මාන්ත කළමනාකරණය
(ඔ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් විෂය ක්ෂේත්‍රයක්

II. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

III. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට සේවයේ වසර දහ අටකට (18) නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

V. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

VI. තුන්වන කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

04. උසස් කිරීමේ ක්‍රමය

4.1 සේවා ව්‍යවස්ථාවට අංක 2196/42 හා 2020.10.08 දිනැතිව කරන ලද 5 වන සේවා ව්‍යවස්ථා සංශෝධනය පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් 2024.07.01 දිනට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර විශේෂ ශ්‍රේණියට පත් කිරීම සඳහා වන නිර්දේශයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

4.2 ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව 2024.07.01 දිනට විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

05. විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් විශේෂ ශ්‍රේණිය යටතේ අනුමත කර ඇති තනතුරකට පත් කරනු ලැබීමෙන් අනතුරුව එම පත්වීම ලද දින සිට ලිත් මසක කාලයක් ඇතුළත නව

තනතුරේ රාජකාරි භාර ගැනීමට කටයුතු කළ යුතු අතර එලෙස රාජකාරි සඳහා ලිත් මසක් තුළ වාර්තා නොකරනු ලබන නිලධාරීන් වෙත පිරිනමන ලද විශේෂ ශ්‍රේණියේ උසස්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2021හි විධිවිධාන ප්‍රකාරව අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

06. 2024.07.01 දිනට පවත්නා පුරප්පාඩු සඳහා උසස්වීම් කරනු ලබන බැවින් එදිනට සක්‍රීය සේවයේ යෙදී සිටි සුදුසුකම් ලබන නිලධාරීන් තමා විසින් මේ සමඟ වන ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් මා වෙත 2024.08.02 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. 2024.07.01 දිනට ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්නම් පමණක්, අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් දන්වා සිටින අතර, ඉහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති, පෙර උසස්වීම් අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි නමුත් උසස්වීම් නොලද හෝ ඉල්ලුම් කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ද මෙම උසස්වීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

08. තව ද 2024.01.01 දිනට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් වීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන් විසින් මෙම නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම්පත සමඟ 2023 වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව සහ වැටුප් වර්ධක පත්‍රිකාව පමණක් ගොනුවේ අමුණා ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

09. මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,



ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දූරකථන : 0112 688124
ෆැක්ස් : 0112 691690
විද්‍යුත් ලිපිනය : d.psd.pubad@gmail.com

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන අයදුම්පත

කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

අයදුම්පත් අංකය

| |
|---|
| S |
| F |

**(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

**1.** නම -

**1.1** සම්පූර්ණ නම : ..................................................................................මෙය/මිය/මයා

**1.2** පත්වීම් ලිපියෙහි සඳහන් නම : ..........................................................................

**2.** ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

(ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපතක් අංක 02 වශයෙන් අමුණා එවිය යුතුයි.)

**3.** උපන් දිනය : ...........................................................................................................

**4.** පෞද්ගලික ලිපිනය : ..................................................................................................

**5.** දුරකථන අංකය - **5.1** නිවස : .................................... **5.2** ජංගම : ....................................

**5.3** විද්‍යුත් තැපැල් ලිපිනය : ..........................................................................................

**6.** **6.1** තනතුර :..............................................................................................................

(දැනට දරන / දැනට විශ්‍රාමික නම් විශ්‍රාම යන අවස්ථාවේදී දැරූ)

**6.2** දැනට විශ්‍රාමික නම් විශ්‍රාම ගත් දිනය : ...............................................................

**7.** අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව : ..............................................................................

**8.** කාර්යාලීය ලිපිනය : ...................................................................................................

**9.** **9.1** කාර්යාලීය දුරකථන අංකය : ..........................................................................

**9.2** කාර්යාලීය ෆැක්ස් අංකය : ..............................................................................

**10.** පත්වීම් / උසස්වීම් දින -

**10.1** ශ්‍රී ලං.ක්‍රි.සේ. III ශ්‍රේණියට පත්වීම් දිනය : .................................................

**10.2** ශ්‍රී ලං.ක්‍රි.සේ. II ශ්‍රේණියට උසස් වීම් දිනය : ...............................................

**10.3** ශ්‍රී ලං.ක්‍රි.සේ. I ශ්‍රේණියට උසස් වීම් දිනය : .................................................

( I ශ්‍රේණියට උසස්වීම් ලිපියේ සහතික කළ පිටපත 10.3 වශයෙන් අංක කර ඇමිණිය යුතුය.)

**11.** **I ශ්‍රේණියට උසස් වීමෙන් පසු සේවයේ නොසිටි කාල සීමාවන් සහ විනයානුකූල දඬුවම් ලැබීම මත සේවා කාලය අඩුවීම් -**

**11.1 නිවාඩු ලබා ගැනීම මත සේවා කාලය අඩුවීම (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න)**

| අනු අංකය | නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසි | කාල සීමාව | | සේවා කාලය අඩුවන දින ගණන | | |
|---|---|---|---|---|---|---|
| | | සිට | දක්වා | අවු: | මාස | දින |
| i | ආයතන සංග්‍රහයේ V:2.5.4 | | | | | |
| ii | ආයතන සංග්‍රහයේ XII:16 | | | | | |
| iii | ආයතන සංග්‍රහයේ XII:36 | | | | | |
| iv | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 | | | | | |
| v | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 | | | | | |
| vi | වෙනත් වැටුප් රහිත නිවාඩු | | | | | |
| vii | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 අනුව වැටුප් රහිත දේශීය/ විදේශීය නිවාඩු | | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | | | |

**(නිවාඩු අනුමත කළ ලිපිවල සහතික කළ පිටපත් 11.1.i, 11.1.ii, 11.1.iii ආදී වශයෙන් කරුණට අදාළව අංක කර ඇමිණිය යුතුය.)**

**11.2 නිලධාරියා/ නිලධාරිනිය ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 14 අනුව විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන ඇත/ නැත**
**කාල සීමාව..............................................සිට..................................දක්වා**

**11.3 විනය කරුණු මත සේවා කාලය අඩු වීම (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න)**

| විනය තීරණය | චෝදනා පත්‍රය අනුව වරද සිදුවූ කාල සීමාව | සේවා කාලය අඩුවන දින ගණන | | |
|---|---|---|---|---|
| | | අවු: | මාස | දින |
| I. වැටුප් වර්ධක .........ක් විලම්භනය කිරීම | | | | |
| II. වෙනත් | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | |

**(විනය තීරණවල සහතික කළ පිටපත් 11.3.i, 11.3.ii ආදී වශයෙන් කරුණට අදාළව අංක කර ඇමිණිය යුතුය.)**

**11.4 11.1 හා 11.3 හි මුළු එකතුව : අවු. ................ මාස .............. දින ................**

**11.5 I ශ්‍රේණියට පත්වූ දිනෙන් ඉදිරියට ඉහත 11.4 හි කාල සීමාව ඉවත් කළ විට දිනය : ...................................**

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුව සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.**

**12.1 උසස් වීමට සුදුසුකම් ලබන 2024.07.01 දිනට පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක** උපයාගෙන <u>ඇත / නැත.*</u>**

**(ආයතන සංග්‍රහයේ XII:16:9, XII:16:10 සහ XII:36:1:4(i) හා (ii) යටතේ ලබා ඇති වැටුප් වර්ධක උසස් වීම් සඳහා පිළිගනු නොලැබේ.)**

***(අදාළ නොවන වචනය කපා හරින්න)**

**12.2 උසස් වීමට සුදුසුකම් ලබන 2024.07.01 දිනට පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක ලබා නොමැති නම් වැටුප් වර්ධක 05 ලබන දින තෙක් උසස් වීමට සුදුසුකම් ලබන දිනය නැවත ගණනය කළ යුතුය. ඒ අනුව සුදුසුකම් ලබන දිනය** : .....................**

****(වැටුප් වර්ධක පත්‍රිකා පහේ (05) සහතික කළ පිටපත් 12.1 සිට 12.5 දක්වා අංක කර අමුණන්න)**

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුව විනයානුකූල දඬුවම් ලබා නොමැති වීම**

**13.1 ගොනුව අනුව, උසස් වීමට සුදුසුකම් ලබන 2024.07.01 දිනට පූර්වාසන්න වසර 05 තුළ කිසිදු විනය දඬුවමකට ලක් වී නොමැත. (දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මේ බව ලිඛිත ප්‍රකාශයකින් සහතික කළ යුතුය - ඉල්ලුම්පතෙහි "ආ" කොටස යටතේ)**

**13.2 13.1 හි සඳහන් කාලසීමාව තුළ විනය දඬුවමකට ලක්ව ඇති අතර 11.3 යටතේ කරුණු සඳහන් කර ඇත්නම් සහ ඒ අනුව උසස් වීම් දිනය සංශෝධනය වේ නම් එම දිනය : ...............................**

**13.3 උසස් වීමට සුදුසුකම් ලබන දිනය 12.2 හා 13.2 අනුව සංශෝධනය වේ නම් නව සංශෝධිත දිනය : .............................**

**14. පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයුම අනුව වැඩ හැසිරීම යහපත් බව පිළිබිඹු වීම.**
**ඉහත 12 හෝ 13 අනුව සුදුසුකම් ලබන දිනට අදාළ වර්ෂයට පූර්වාසන්න වර්ෂ 05 පහත වගුවෙහි පළමු තීරුවේ සටහන් කළ යුතුය. අදාළ කාර්ය සාධන වාර්තා 05 හි සහතික කළ පිටපත් ඇමිණිය යුතුය. කාර්ය සාධන වාර්තාවේ අවසාන ඇගයුමෙහි විකල්ප නිර්දේශ එකකට වඩා දක්වා ඇති සහ අදාළ නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති වාර්තා පිළිගනු නොලැබේ.**

| වර්ෂය | අවසාන ඇගයුම<br>විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | අදාළ නිලධාරියා අත්සන් තබා ඇත / නැත |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

එක් එක් වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව සෑම පේළියක් හා තීරුවක්ම සම්පූර්ණ කළ යුතුය.

**15.** සේවා ව්‍යවස්ථාවේ 10.3.1 (i) සුදුසුකම සම්පූර්ණ කර තිබීම

| 15.1 අනු අංකය | 15.2 පශ්චාත් උපාධියේ නම | 15.3 විෂය ක්ෂේත්‍රය | 15.4 එම උපාධිය පිරිනමන ලද විශ්ව විද්‍යාලය / ආයතනය | 15.5 එම විශ්ව විද්‍යාලය, විශ්ව විද්‍යාලයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගෙන තිබේද යන වග | 15.6 උපාධි කාල සීමාව (ආරම්භක හා අවසාන දිනය) | 15.7 උපාධිය වලංගු දිනය |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |

(15.1 වශයෙන් අංක යොදා උපාධි සහතිකය සහ විස්තරාත්මක ප්‍රතිඵල සටහනෙහි සහතික කළ පිටපත් ඇමිණිය යුතුය.)

**16.** උසස් වීමට සුදුසුකම් ලබන 2024.07.01 දිනට සේවයේ වසර දහඅට (18) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. / නැත.*

**17.** තුන්වන (03) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

17.1 සම්පූර්ණ කළ යුතු දිනය : .......................................

17.2 සම්පූර්ණ කළ දිනය : .......................................

(17 වශයෙන් අංක යොදා අදාළ සහතික පත්‍රයේ සහතික කරන ලද පිටපතක් ඇමිණිය යුතුය)

ඉහත අංක 01 සිට 17 තෙක් නිරවද්‍ය හා සම්පූර්ණ තොරතුරු සහිත ඉල්ලුම්පත සහ අමුණා එවන ලෙස සඳහන් කර ඇති සියලු ලේඛන වල සහතික කළ පිටපත් කරුණට අදාළ අංකය එක් එක් ලේඛනයේ දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර අංක පිළිවෙලින් අමුණා ගොනුවක් වශයෙන් සකස් කර, මේ සමඟ ඉදිරිපත් කරමි.

තවද මා විසින් උසස් කිරීම මත පත් කරනු ලැබීමට ඉල්ලා ඇති ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් පුරප්පාඩුව පවතින ඕනෑම සේවා ස්ථානයකට/එම ස්ථානවලට ඉතා ආසන්න ස්ථානයක ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් සඳහා පත් කරනු ලැබීමට කැමැත්ත ප්‍රකාශ කරමි.

ලිත් මසක් ඇතුළත එම තනතුර භාර ගැනීමට අපොහොසත් වුවහොත් උසස් කිරීමට පෙර සිටි ශ්‍රේණියට සහ තනතුරට පෙරලා යවනු ලැබීමට මෙයින් කැමැත්ත ප්‍රකාශ කරමි.

දිනය : ............................ ............................................

ඉල්ලුම්කරුගේ අත්සන
තනතුරු නාමය සහ නිල මුද්‍රාව

**(ආ) කොටස - දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

**ලේකම්,**

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය / අදාළ අමාත්‍යාංශය**

**1.** **නිලධාරියා ඉහත සඳහන් කර ඇති සියලු කරුණු නිවැරදිය.**

**2.** **අංක 11,12 හා 13 ට අදාළ කරුණු ගොනුව අනුව සසඳා බලන ලදී. සඳහන් කර ඇති කරුණු නිවැරදි බවද සියලු තොරතුරු සම්පූර්ණව ඉදිරිපත් කර ඇති බවද අදාළ සියලු ලේඛන වල සහතික කළ පිටපත් අමුණා ඉදිරිපත් කර ඇති බව ද සහතික කරමි.**

**3.** **නිලධාරියාට එරෙහිව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ විනය පරීක්ෂණ සිදු වෙමින් පවතියි / නොපවතියි**

**3.1** **ඉහත පිළිතුර ‘‘පවතියි’’ නම් වරද කළ දිනය : ..............................................**

**3.2** **විනය බලධාරියා විසින් චෝදනා පත්‍රය නිකුත් කළ දිනය : ..............................................**

**4.** **........................................................................................ මහතා / මහත්මිය / මෙනවිය ගේ රාජකාරී, පැමිණීම හා හැසිරීම සතුටුදායකය. ඔහුගේ / ඇයගේ කාර්යසාධනය, නායකත්වය, හැකියාව හා ඊළඟ උසස් වීමට අදාළව තනතුරු හා වගකීම් දැරීමේ හැකියාව සලකා බැලීමි. ඔහු / ඇය ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/ නොකරමි.**

**5.** **නිවැරදිව, අනූනව සම්පූර්ණ කළ අයදුම්පතද, එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙළින් අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමඟ එවමි.**

**දිනය : .................................** **..............................................**

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ**
**අත්සන, තනතුරු නාමය**
**සහ නිල මුද්‍රාව**

**සටහන : නොගැළපෙන වචන කපාහරින්න.**

**(ඇ) කොටස - අදාළ අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් ප්‍රධාන ලේකම් විසින් සම්පූර්ණ කළ යුතුය.**

**ලේකම්,**

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

1. **ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ ................................................ මහතා / මහත්මිය / මෙනවියගේ රාජකාරී හා හැසිරීම පිළිබඳව දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමඟ එකඟ වෙමි / එකඟ නොවෙමි.**
2. **නිලධාරියාගේ රාජකාරී, හැසිරීම, විශේෂ කුසලතා හා කාර්ය සාධනය ඇගයීමට ලක්කළෙමි. ............................................................ මහතා / මහත්මිය / මෙනවිය 2024.07.01 දිනට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.***
   **(*නිර්දේශ නොකරන්නේ නම්, හේතුව කෙටියෙන් සඳහන් කරන්න.)**
   **.....................................................................................................................................**
   **.....................................................................................................................................**
3. **නිවැරදිව, අනූනව සම්පූර්ණ කළ අයදුම්පතද, එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙළින් අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමඟ එවමි.**

**.................................** | **................................................**
---|---
දිනය | අමාත්‍යාංශ ලේකම්ගේ/ පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන

නිල මුද්‍රාව :